

# තේ කතා

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි

ISSN - 1391- 6785

තෙවන කාණ්ඩය, 1 සහ2 කලාප 2003

## කුඩා තේ වතු සඳහා අපගේ දායකත්වය

තේ පර්යේෂණායතනයේ නව සොයා ගැනීම් ප්‍රචලිත කිරීමටත්, කාලීන ගැටළු වලට විසඳුම් සාකච්ජා කිරීමටත් පසුගිය කාල පරිච්ජේදයේ දී ව්‍යාප්ති හා පර්යේෂණ සංසද දෙකක් පවත්වන ලදී. මෙම වැඩ සටහන් වලදී කුඩා තේ වතු ක්ෂේත්‍රයේ නිලධාරීන් සහ තේ පර්යේෂණායතනයේ නිලධාරීන් අතර සෘජු සංවාද තුලින් ක්ෂේත්‍රයේ සිටින කුඩා තේ වතු හිමියන්ගේ ගැටළු පිලිබඳ පුළුල් ව අධ්‍යයනය කරන ලදී.

2003 මැයි 05 වැනි දින පැවති පර්යේෂණ ව්‍යාප්ති සංසදයේදී, ශෂ්‍ය විද්‍යා අංශයේ ශ්‍යාමන්ත බණ්ඩාර තේ වගාව සඳහා බින්දු ජල සම්පාදනය, පී බී ඒකනායක තේ වගාවේ අතුරු බෝග වගාව, සහ ආර්ථික විද්‍යා අංශයේ ජයකොඩි මහත්මිය අතුරු බෝග වගාවේ ආර්ථික වාසි යන මාතෘකා යටතේද දේශන ඉදිරිපත් කරන ලදී.

2003 ඔක්තෝබර් මස 13 දින පැවති පර්යේෂණ හා ව්‍යාප්ති සංසදයේදී ශාක අභිජනන අංශයේ මහින්ද රත්නායක විසින් අනාගතය සඳහා නව තේ ප්‍රභේද යන මාතෘකාව යටතේ ද, පාංශු හා ශාක පෝෂණ අංශයේ ආචාර්ය කපිල සොයිසා විසින්, තේ වගාවේ ඒකාබද්ධ පෝෂක පාලනය යන මාතෘකා යටතේද, උපදෙස් හා ව්‍යාප්ති අංශයේ ලලිත් අමරතුංග කෘෂි කාලගුණය සහ තේ වගාවේ අස්වැන්න යන මාතෘකාව යටතේ ද දේශණ පවත්වන ලදී.

තවාන් සඳහා පාංශු ආදේශක හඳුන්වා දීම හා සූර්යාලෝකය මගින් වටපනුවන් සඳහා ප්‍රතිකාර කිරීම පිලිබඳ ක්ෂේත්‍ර ආදර්ශන කිහිපයක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ති නිලධාරීන් සඳහා පවත්වන ලදී. මහනුවර, ගම්පොල, කෑගල්ල, කළුතර, රත්නපුර, මාතර, ගාල්ල හා බණ්ඩාරවෙල යන කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වලදී මෙම ආදර්ශණ පසුගිය මාස කිහිපය පුරා සැලකිය යුතු නිලධාරීන් පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙම ආදර්ශණ තේ පර්යේෂණායතනයේ උපදෙස් හා ව්‍යාප්ති සේවය හා කීට විද්‍යා අංශයේ සංවිධානයෙන්, තේ පර්යේෂණායතනයේ කීට විද්‍යාඥ අයි සුශිලා විතාරන මහත්මියගේ මෙහෙයවීමෙන් සිදු කරන ලදී.

තේ සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය දායකත්වයෙන් සහ සංවිධානත්වයෙන් 2003 වසර ඔක්තෝබර් මස සිට ජාතික රූපවාහිනය ඔස්සේ ප්‍රචාරණය වූ "රන් පතක අසිරිය" වැඩ සටහනේ තේ තවාන් පාලනය, තේ දළු නෙලීමට කතුරු භාවිතය හා අතුරු බෝග වගාව, කාබනික තේ වගාව, තේ රෝග පාලනය පිලිබඳ සාකච්ජා කිරීමට තේ පර්යේෂණායතනයේ පර්යේෂණ සහ උපදේශක නිලධාරීන් ඉදිරි පත්විය.

තේ සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය දායකත්වයෙන් සහ සංවිධානත්වයෙන් 2003 වසරේ අගෝස්තු මස සිට කඳුරට එෆ් එම් සහ රුහුණ එෆ් එම් නාලිකා ඔස්සේ ප්‍රචාරනය වූ "රන් දල්ලට අරුණැල්ලක්" වැඩ සටහන් මාලාව ඔස්සේ තේ වගාවේ පෝශක පාලනය, තවාන් පාලනය, තේ දළු නෙලීම, අතුරු බෝග වගාව, සහ තේ රෝග පාලනය ඇතුළු මාතෘකා රැසක් පිලිබඳ සාකච්ජා කිරීමට තේ පර්යේෂණායතනයේ පර්යේෂණ සහ උපදේශක නිලධාරීන් සහභාගී විය. දෙනියාය තේ පර්යේෂණායතනයේ ස්ථානභාර නිලධාරී ශාන්ත ජයසිංහ මහතාගේ මූලිකත්වයෙන් මෙම වැඩ සටහන් මාලාව සංවිධානය විය.

සුරංජන් ප්‍රනාන්දු